සවියෙන් පෙරට - අපි එකට

e - ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | පුරවැසි අධ්‍යාපනය | 2 | 2. ආණ්ඩුවේ විවිධ ස්තර |

සැකසුම: ජේ.එස්.පී.ආර්.සිරිවර්ධන
පාසල : බප / හො / රෙමුණ මහා විද්‍යාලය

# හැඳින්වීම

- පුරවැසි අවශ්‍යතා උපරිම අයුරින් ඉටු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක ප්‍රධානතම වගකීම වේ. නූතන සමාජයේ විවිධ මිනිස් අවශ්‍යතා සංකීර්ණ වී ඇති අතර ආණ්ඩුවේ කාර්ය ද එයට සාපේක්ෂව සංකීර්ණ වී ඇත. මෙම සංකීර්ණ කාර්යභාරය ආණ්ඩුවේ විවිධ ස්තර මඟින් ක්‍රියාවට නංවනු ලබයි. ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ විවිධ ස්තර ලෙස මධ්‍යම ආණ්ඩුව පළාත් සභා හා පළාත් පාලන ආයතන යන ස්තර තුන පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

# ආණ්ඩුවේ විවිධ ස්තර

- වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ඒකීය ආණ්ඩු ක්‍රමයකි
- තනි මධ්‍යම ආණ්ඩුවක් මගින් ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ කටයුතු මෙහෙයවන්නා වූ ආණ්ඩුක්‍රමයක් ලෙස ද මෙය හැඳින්විය හැකි ය.
- මහා බ්‍රිතාන්‍යය, ජපානය, ප්‍රංශය වැනි සංවර්ධිත රටවල් මෙන් ම පාකිස්ථානය, බංග්ලාදේශය, නේපාලය වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල් ද ඒකීය රාජ්‍යවලට උදාහරණ වේ.

# ආණ්ඩුවේ විවිධ ස්තර

✓ එක් මධ්‍යම බල ආයතනයක් පමණක්, **නීති පැනවීම** පිළිබඳව උත්තරීතර බලය ඉසිලීම ඒකීය ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණයයි

**-ඒ.වී. ඩයිසි-**

✓ ඒකීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ දෙකකි. එනම්

1. මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතර භාවය
2. අතිරේක ස්වාධිපති ආයතන ආණ්ඩුක්‍රමය තුළ නොමැති වීම

**- සී.එන්. ස්ට්‍රෝන්ග් -**

- අතීතයේ මධ්‍යම පාලනය හැරුණු විට රජුගේ පාලන කටයුතුවල සහායට ප්‍රාදේශීය ඒකක සැකසී තිබිණි. එනම්
    - ✓ උත්තර පස්ස
    - ✓ ප්‍රාචීන පස්ස
    - ✓ දක්ඛිණ පස්ස
    - ✓ පශ්චිම පස්ස
- අනුරාධපුර යුගයේ අග භාගය වන විට රජරට, රුහුණු රට, මලය රට හා දක්ඛිණ දේශය යනුවෙන් පාලන ඒකක කිහිපයක් ම පැවති අතර පොළොන්නරුව යුගය වන විට රජරට, දක්ඛිණ දේශය, දොළොස් දහස් රට, අට දහස් රට යනුවෙන් කොටස් හතරක බෙදී පැවතිණි. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේ දිසාව, කෝරළ, පත්තු වැනි පරිපාලන කොට්ඨාස ක්‍රියාත්මක විය.


# ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත්විජිතයක් බවට පත්වීමෙන් පසු පාලන කටයුතුවල ඇති වූ වැදගත් වෙනස්වීම් .........

## 1833 - කොල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

ව්‍යවස්ථාදායක සභාව 15

- නිලලත් - 09
- නිලනොලත් - 06
  - ව්‍යවස්ථාදායක සභාව - 15
  - යුරෝපීය - 03
  - සිංහල - 01
  - දෙමළ - 01
  - බර්ගර් - 01

# 1910 - කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ව්‍යවස්ථාදායක සභාව - 21



# 1921 - මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

**ව්‍යවස්ථාදායක සභාව - 37**

- නිලලත් - 14
  - නිල බලයෙන් 05
  - ආණ්ඩුකාරවරයා නම් කිරීමෙන් - 09
- නිලනොලත් - 23
  - ඡන්ද බලයෙන් - 16
    - ජනවර්ග හා වෘත්තීන් අනුව - 05
      - ✓ යුරෝපීය - 02
      - ✓ බර්ගර් - 01
      - ✓ වෙළෙඳ මණ්ඩලය - 01
      - ✓ පහතරට නිෂ්පාදකයන්ගේ සංගමය - 01
    - පළාත්බද ඡන්ද කොට්ඨාස තුළින් - 11
      - ✓ කොළඹ -01
      - ✓ බස්නාහිර පළාත - 02
      - ✓ සෙසු පළාත්වලට එක බැගින් - 08
  - නම් කිරීමෙන් - 07
    - ✓ උඩරට සිංහල - 02
    - ✓ මුස්ලිම් -01
    - ✓ ඉන්දීය දෙමළ - 01
    - ✓ විශේෂ - 03

# 1931 - ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

## රාජ්‍ය මන්ත්‍රණ සභාව - 58

- පළාත්බද ඡන්ද කොට්ඨාස තුළින් - 50
- රාජ්‍ය නිලධාරීන් - 03
  - රාජ්‍ය ලේකම්
  - මුදල් ලේකම්
  - නීති ලේකම්
- ආණ්ඩුකාරයා විසින් නම් කරනු ලැබීමෙන් -08

- බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දෙන ලද 1833, 1910, 1921, 1924 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් අභ්‍යන්තර ස්වාධීන පාලනයකට ඉඩකඩක් නොලැබිණි. 1931 දී හඳුන්වා දුන් ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ලාංකිකයින්ට දේශපාලන මැදිහත්වීමට තිබූ ඉඩකඩ සාපේක්ෂව වැඩි විය. සර්වජන ඡන්දබලය, පළාත්බද නියෝජනය, විධායක කාරක සභා ක්‍රමය, රාජ්‍ය මන්ත්‍රණ සභාව වැනි ප්‍රගතිශීලී යෝජනා ලාංකේය දේශපාලන ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථාන විය.

# 1947 - සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

## ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව

**මහජන මන්ත්‍රී මණ්ඩලය**
**(නියෝජිත මන්ත්‍රී මණ්ඩලය) - 101**

- මහජන ඡන්දයෙන් - 95
- අග්‍රාණ්ඩුකාරවරයාගේ නාමකරණයෙන් - 06

**සෙනෙට් සභාව**
**(උත්තර මන්ත්‍රී මණ්ඩලය) - 30**

- අගමැති උපදෙස් පරිදි අග්‍රාණ්ඩුකාරවරයා විසින් - 15
- මහජන මන්ත්‍රී මණ්ඩලයේ ඡන්දයෙන් -15

- 1948 පෙබරවාරි 04 බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලැබීම
- කැබිනට් ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දීම
- ද්වි මාණ්ඩලික පාර්ලිමේන්තුව හඳුන්වා දීම
- බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර ධුරයක් ඇති කිරීම
- අවසාන අභියාචනාධිකරණය ලෙස බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සිලය පිළිගැනීම
- රාජ්‍ය සේවා හා අධිකරණ සේවා කොමිෂන් සභා පිහිටුවීම
- සුළු ජාතික අයිතිවාසිකම් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කිරීම


# 1972 -. ශ්‍රී ලංකා පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කිරීම

- ✓ ඩොමිනියන් තත්ත්වය අහෝසි කර ස්වාධීන ජනරජයක් බවට පත් කිරීම
- ✓ ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකය ජාතික රාජ්‍ය සභාව ලෙස නම් කිරීම
- ✓ අග්‍රාණ්ඩුකාර ධුරය අහෝසි කර ජනාධිපති ධුරයක් ඇති කිරීම
- ✓ ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළ ම උසාවිය ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගැනීම
- ✓ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම
- ✓ රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය, රාජ්‍ය සේවා විනය මණ්ඩලය සහ අධිකරණ සේවා උපදේශක මණ්ඩලය, අධිකරණ සේවා විනය මණ්ඩලය පිහිටුවීම
- ✓ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ප්‍රථම වරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම

# 1978 - ශ්‍රී ලංකා දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

- ✓ විධායක බලය සහිත ජනාධිපති ධුරයක් ඇති කිරීම
- ✓ විධායක ජනාධිපති ප්‍රමුඛ අගමැති හා අමාත්‍ය මණ්ඩලයක් හඳුන්වා දීම
- ✓ සරල බහුතර නියෝජන ක්‍රමය අහෝසි කර සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම
- ✓ මහජන ඡන්දයෙන් තේරී පත්වන මන්ත්‍රීවරු 196ක් හා ජාතික ලැයිස්තුවෙන් තේරී පත්වන මන්ත්‍රීවරු 29ක් සහිත 225කින් සමන්විත පාර්ලිමේන්තුවක් හඳුන්වා දීම
- ✓ රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා අධිකරණ සේවා කොමිෂන් සභාව නැවත හඳුන්වා දීම
- ✓ මූලික අයිතිවාසිකම් හඳුන්වා දීම හා ඒවා ආරක්ෂා කිරීමට අවශ්‍ය විධිවිධාන ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම
- ✓ පාර්ලිමේන්තු කටයුතු කොමසාරිස් ධුරයක් ඇති කිරීම (ඔම්බුඩ්ස්මන්)

# ශ්‍රී ලංකාවේ පළාත් සිතියම



# ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක සිතියම

**බස්නාහිර පළාත**

1. කොළඹ
2. ගම්පහ
3. කළුතර

**මධ්‍යම පළාත**


4. මහනුවර
5. මාතලේ
6. නුවරඑළිය

**දකුණු පළාත**

7. ගාල්ල
8. මාතර
9. හම්බන්තොට

**උතුරු පළාත**

10. යාපනය
11. කිලිනොච්චිය
12. මන්නාරම
13. වව්නියාව
14. මුලතිව්




**නැගෙනහිර පළාත**

15. මඩකලපුව
16. අම්පාර
17. ත්‍රිකුණාමලය

**වයඹ පළාත**

18. කුරුණෑගල
19. පුත්තලම

**උතුරු මැද පළාත**

20. අනුරාධපුර

21පොලොන්නරුව

**ඌව පළාත**

22. බදුල්ල
23. මොණරාගල

**සබරගමුව පළාත**

24. රත්නපුර
25. කෑගල්ල

# ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය

ශ්‍රී ලංකාවේ බලය බෙදීම පිළිබඳ ව අදහස ක්‍රියාවට නැංවීමට ගත් උත්සාහ කිහිපයකි. එනම්

- 1928 - ඩොනමෝර් කොමිෂන් සභා වාර්තාව
- 1945 - සෝල්බරි කොමිෂන් සභා වාර්තාව
- 1957 - රට සභා", බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම
- 1965 - දිස්ත්‍රික්ක සභා", ඩඩ්ලි සේනානායක - චෙල්වනායගම් ගිවිසුම
- 1980 - දිස්ත්‍රික්ක සංවර්ධන සභා පිහිටුවීම

# ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ 1987 අංක 42 දරන පළාත්සභා පනත අනුව 1987 සිට පළාත්සභා ස්ථාපිත කිරීමට ව්‍යවස්ථාමය හා නෛතික විධි විධාන ද සලස්වනු ලැබිණි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානවලට යටත්ව සෑම පළාතක් සඳහා ම පළාත් සභාවක් පිහිටුවීමට කටයුතු සලසා ඇත. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන උපලේඛනයට අනුව ශ්‍රී ලංකාව පළාත් නවයකට බෙදා ඇත.

# ශ්‍රී ලංකාවේ පළාත් පාලනය

ශ්‍රී ලංකාවේ පළාත් පාලනය සම්බන්ධ දීර්ඝ ඉතිහාසයක් තිබෙන බව ඓතිහාසික කරුණු වලින් පැහැදිලි වේ. නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- වගකීම් දැරූවන් ගමික, පරුමක, ගම්බෝජක වැනි නම්වලින් හැඳින්වීම; නගර ප්‍රධානීන් නගර ගුත්තික ලෙස හැඳින්වීම

- වේවැල්කැටිය ශිලා ලේඛනයට අනුව ගම් 10ක් පාලන ඒකකයක් ලෙස සලකා දසගම් පාලනය පිළිබඳ ව සඳහන් වීම

- මහනුවර රාජධානි සමයේ පාලනය සඳහා දසගම් පාලනය පිළිබඳ සඳහන් වීම

- මහනුවර රාජධානි සමයේ පාලනය සඳහා මහ දිසා 04ක්, දිසා 08ක් හා රටවල් 09ක් ලෙස රාජධානිය බෙදා තිබූ බව සඳහන් වීම

- ගම් සභාවක් මඟින් ගම පාලනය වූ බව 1681 රොබට් නොක්ස් වාර්තාවේ සඳහන් වීම

- ප්‍රාදේශීය හා නාගරික වශයෙන් මධ්‍යම ආණ්ඩුව විසින් පළාත් පාලන ආයතන පිහිටුවා තිබෙන අතර අදාළ ප්‍රදේශයේ ජනතාව විසින් තෝරා පත් කරගනු ලැබූ නියෝජිතයන්ගෙන් පළාත් පාලන ආයතන සමන්විත වේ.
- මධ්‍යම ආණ්ඩුවේ කාර්යය පහසු කිරීම සඳහාත් ප්‍රජා අවශ්‍යතා ඉතා කඩිනමින් ජනතාවට ඉටු කර දීම සඳහාත් පළාත් පාලන ආයතන පද්ධතියක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වෙයි.
- මධ්‍යම ආණ්ඩුවකින් ද, පළාත් සභා සහ පළාත් පාලන ආයතන යන ආණ්ඩු ස්තර කිහිපයකින් ද ශ්‍රී ලංකාවේ පාලන කටයුතු මෙහෙයවනු ලබයි.

# ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතු

➢ ***ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සඳහා වර්තමානයේ පළාත් සභා සහ පළාත් පාලන ආයතන පිහිටුවා ඇත***

- ඒකීය රාජ්‍ය ව්‍යූහයක් තුළ පළාත් මට්ටමින් ජනතාවට බලය පැවරීම
- පළාත් මට්ටමින් විවිධ ජන කොටස්වල සංස්කෘතික හා භාෂාමය අනන්‍යතා තහවුරු කිරීම
- ඒ ඒ පළාත්වල සංවර්ධන හා පරිපාලනමය කටයුතු කඩිනම් කිරීම හා එමඟින් ජන ජීවිතයේ දෛනික කටයුතුවලදී පැන නැගෙන ගැටලු විසඳීම වඩාත් පහසු කරවීම
- ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් කිරීම
- ප්‍රාදේශීය සම්පත් හඳුනා ගැනීම හා ඒවා කාර්යක්ෂමව යොදා ගැනීම

# ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතු

- පාලන කටයුතු සඳහා පුළුල් ජනතා සහභාගිත්වයක් ඇති කිරීම
- ජනතාවගේ මූලික අවශ්‍යතා පහසුවෙන් ඉටු කරලීම
- ජනතාවට වඩාත් සමීප වූ පරිපාලන ඒකක පිහිටුවීම
- ප්‍රාදේශීය නායකත්වය වර්ධනය කිරීම මඟින් ජාතික නායකත්වයට හා තරුණ නායකත්වයට අවස්ථාව ලබා දීම
- මධ්‍යම ආණ්ඩුවේ කාර්ය ලිහිල් කිරීම

# බලය විමධ්‍යගත කිරීමේ දී මතුවන ගැටලු

- සම්පත් බෙදී යාමේ විෂමතා නිසා සමහර ප්‍රාදේශීය ඒකකවලට වාසිත් ඇතැම් ප්‍රාදේශීය සභාවලට අවාසිත් සිදු වීම

- ප්‍රාදේශීය පාලන ඒකකවල කාර්යභාරය හා ජනතා අවශ්‍යතා ඉටු කර ගැනීමට යොමුවිය යුතු ආකාරය පිළිබඳ ව ජනතාවගේ දැනුම ප්‍රමාණවත් නොවීම

- බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය ඒකක අතර ගැටලු ඇති වීම

- සංවර්ධන කාර්ය ඉටු කිරීමේ දී පළාත් සභාවලට හා පළාත් පාලන ආයතනවලට ප්‍රමාණවත් බලතල නොමැති වීම

- සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට මුදල් උපයා ගැනීමේ දුෂ්කරතා

- ආයතන කිහිපයක් එක ම කාර්යයෙහි යෙදීම නිසා එම ආයතනවල වගවීම හා වගකීම සම්බන්ධ ගැටලු මතු වීම

# ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුව, පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල බලතල හා කාර්ය

- මධ්‍යම ආණ්ඩුවේ ව්‍යූහය - බලතල හා කාර්ය

**මධ්‍යම ආණ්ඩුව**

**විධායකය ජනාධිපති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය**

- රාජ්‍ය සේවය පාලනය
- රාජ්‍ය ආරක්ෂක කාර්ය
- රාජ්‍ය මූල්‍ය පාලනය
- විදේශ කටයුතු පිළිබඳ කාර්ය
- ව්‍යවස්ථාදායක කාර්ය
- අධිකරණ කාර්ය
- නියෝග හා ආඥා පැනවීම

**ව්‍යවස්ථාදායකය (පාර්ලිමේන්තුව)**

- නීති පැනවීම
- විධායකයට අවශ්‍ය බහුතරය සැපයීම
- විධායකය පාලනය
- අයවැය පාලනය
- දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම
- ප්‍රශ්න ඇසීම
- ආණ්ඩුවේ ක්‍රියාමාර්ග සාධාරණව විවේචනය කිරීම

**අධිකරණය (ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රමුඛ අධිකරණ පද්ධතිය)**

- නීති විවරණය කිරීම
- යුක්තිය පසිඳලීම
- උපදේශන කාර්ය
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම
- පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂකයකු ලෙස ක්‍රියා කිරීම
- ශ්‍රේෂ්ඨාධිකරණය සතු විශේෂ කාර්ය ක්‍රියාත්මක කිරීම

# විධායකය

- 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා රජයේ ප්‍රධානියා ද,විධායකයේ ප්‍රධානියා ද, සන්නද්ධ සේවාවල සේනාධිනායකයා ද වන අතර ආණ්ඩුවේ ප්‍රධානියා ලෙස ද කටයුතු කරයි

- 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (1) ව්‍යවස්ථාවට අනුව විධායක ජනාධිපති තනතුර මෙසේ හඳුන්වා ඇත.

- ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයෙක් වන්නේ ය.
- ජනාධිපතිවරයා රජයේ ප්‍රධානියා ද, විධායකයේ ප්‍රධානියා ද, ආණ්ඩුවේ ප්‍රධානියා ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකවරයා ද වන්නේ ය".

# 1978 ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාදායක බලතල

- පාර්ලිමේන්තුව කැඳවීම, වාර අවසාන කිරීම හා විසුරුවා හැරීම
- පාර්ලිමේන්තු සැසි වාර ආරම්භයේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කිරීම
- විශේෂ පනත් කෙටුම්පත් ජනමත විචාරණයකට යොමු කිරීම

උදාහරණ :-

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1,2,3,6,7,8,9,10,11,30(2) සහ 62(2) වගන්ති සංශෝධනය
2. අමාත්‍ය මණ්ඩලය විසින් ජනමත විචාරණයකින් සම්මත විය යුතු යැයි තීරණය කළ පනත්
3. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජනමත විචාරණයකින් සම්මත විය යුතු යැයි තීරණය කළ පනත්

- ජනමත විචාරණයකින් සම්මත වූ පනතක් නීතිගත කිරීම
- පාර්ලිමේන්තුව ඇමතීම, සංදේශ යැවීම

# 1978 ව්‍යවස්ථාදායකය (පාර්ලිමේන්තුව)

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, මැතිවරණ දිස්ත්‍රික්ක 22ක ඡන්ද හිමියන් විසින් තෝරා පත් කර ගනු ලබන මන්ත්‍රීවරුන් 196 දෙනකු සහ ජාතික ලැයිස්තුවෙන් තෝරා පත් කරගනු ලබන මන්ත්‍රීවරුන් 29 දෙනකුගෙන් පාර්ලිමේන්තුව සමන්විත වේ.

- මහජන ඡන්දයෙන් තේරී පත්වන මන්ත්‍රී සංඛ්‍යාව - 196
- ජාතික ලැයිස්තුවෙන් තේරී පත්වන මන්ත්‍රී සංඛ්‍යාව - 29
- පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාව - 225

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පාර්ලිමේන්තුවේ නිල කාලය වසර හයකි. ඒ අනුව අවුරුදු හයකට වරක් පැවැත්වෙන පාර්ලිමේන්තු මහ මැතිවරණයක් මඟින් ව්‍යවස්ථාදායකය සඳහා නියෝජිතයෝ තෝරා පත් කර ගැනෙති.

# ව්‍යවස්ථාදායකයේ (පාර්ලිමේන්තුවේ) බලතල හා කාර්ය

- මහා මැතිවරණයකින් පසු තේරී පත්වන පාර්ලිමේන්තුවේ පළමු කාර්යය වන්නේ පාර්ලිමේන්තුව මෙහෙයවීම සඳහා කථානායකවරයකු, නියෝජ්‍ය කථානායකවරයකු හා නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයකු මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් තෝරා පත් කර ගැනීමයි. ව්‍යවස්ථාදායකයේ බලතල හා කාර්ය පහත දක්වා ඇත.

# ව්‍යවස්ථාදායකයේ (පාර්ලිමේන්තුවේ) බලතල හා කාර්ය

1. නීති සම්පාදනය කිරීම/නීති පැනවීම
2. විධායකය පාලනය කිරීම
3. අයවැය පාලනය/ මූල්‍ය පාලනය
4. ප්‍රශ්න ඇසීම
5. මහජන දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම
6. ආණ්ඩුව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග සාධාරණව විවේචනය කිරීම
7. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට දායක වීම
8. දෝෂාභියෝග ඉදිරිපත් කිරීම
9. විශ්වාසභංග යෝජනා ඉදිරිපත් කිරීම
10. අනාගත පාලකයින් පුහුණු කිරීම
11. නීති සම්මත කිරීම

# අධිකරණය

ශ්‍රී ලංකාවේ අධිකරණ ආයතන රාශියක් පවතී. ඒ පිළිබඳ ‘‘නීතිය හා යුක්තිය” ඒකකයේ පැහැදිලිව සඳහන් කර ඇත. මෙම විවිධ අධිකරණ ආයතන මඟින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් කිහිපයකි. එනම්

1. නීති විවරණය කිරීම
2. නඩු විනිශ්චය කිරීම/යුක්තිය පසිඳලීම
3. පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කර දීම
5. පළාත් සභා, පළාත් පාලන ආයතන හා මධ්‍යම ආණ්ඩුව අතර ඇතිවන ගැටුම් විසඳීම
6. නීති සම්පාදනය සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම

# පළාත් පාලන ආයතනවල ව්‍යුහය, - බලතල හා කාර්ය

- වර්තමාන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග තුනකි.
    - මහනගර සභා
    - නගර සභා
    - ප්‍රාදේශීය සභා

- මධ්‍යම ආණ්ඩුව මඟින් ප්‍රාදේශීයව ඉටු කළ යුතු සංවර්ධන කටයුතු හා ශුභසාධන කටයුතු පහසු කර ගැනීම සහ කාර්යක්ෂම මහජන සේවාවක් සැපයීම ඉලක්ක කර ගනිමින් පළාත් පාලන ආයතන පිහිටුවා ඇත. එමඟින් ප්‍රාදේශීය අවශ්‍යතා පහසුවෙන් හඳුනාගෙන මහජනතාවට කඩිනම් සේවාවක් සැපයීම සඳහා මෙම ආයතන ක්‍රියාත්මක වේ.

# පළාත් පාලන ආයතනවල ව්‍යුහය, - බලතල හා කාර්ය

- මහනගර සභාවක ප්‍රධානියා - නගරාධිපති (පුරපති)
- නගර සභාවක ප්‍රධානියා - සභාපති
- ප්‍රාදේශීය සභාවක ප්‍රධානියා - සභාපති

➢ මෙම ආයතන සඳහා නියෝජිතයින් තෝරා පත් කරගනු ලබන්නේ වසර 04කට වරක් පවත්වනු ලබන ''පළාත් පාලන ආයතන'' මැතිවරණ මගිනි. නාගරික ප්‍රදේශවලින් මෙන් ම ග්‍රාමීය ප්‍රදේශවලින් ද දේශපාලන නායකයින් බිහිවීමට පළාත් පාලන ආයතන මැතිවරණ උපකාරී වේ

# මහ නගර සභා

- 1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනත මඟින් මහ නගර සභා පිහිටුවා ඇත. යම් ප්‍රදේශයක් සඳහා මහ නගර සභාවක් ප්‍රකාශයට පත් කිරීම, එහි සීමාව නිශ්චය කිරීම, එයට නමක් නියම කිරීම ආදියේ බලය අදාළ විෂය භාර අමාත්‍යවරයාට පවරා ඇති මහ නගර සභාවක් ඇති කරනු ලබන්නේ ඉහළ මට්ටමේ නාගරික ලක්ෂණ පෙන්නුම් කරන ප්‍රදේශ සඳහා ය. දැනට ශ්‍රී ලංකාවේ මහ නගර සභා 23ක් ක්‍රියාත්මක වේ. මහ නගර සභාව නගරාධිපතිවරයකුගෙන්, නියෝජ්‍ය නගරාධිපතිවරයකුගෙන් සහ සභිකයින්ගෙන් සමන්විත වේ.

# මහ නගර සභාවලට පැවරී ඇති බලතල

- නාගරික කලාපයට ජලය සැපයීම
- විදුලි ආලෝකය සැපයීම
- නගර අලංකාර කිරීම
- කුණු කසළ ඉවත් කිරීම
- අලුත් මාර්ග ඉදි කිරීම
- නිවාස යෝජනා ක්‍රම සකස් කිරීම
- පුස්තකාල පහසුකම් ඇති කිරීම
- ප්‍රජා ශාලා ඇති කිරීම
- ක්‍රීඩාපිටි, ක්‍රීඩාගාර පවත්වා ගෙන යාම
- පොදු වැසිකිළි - කැසිකිළි පවත්වා ගෙන යාම
- විනෝද ස්ථාන පාලනය කිරීම

# ▪ නගර සභා

- 1939 අංක 61 දරන නගර සභා ආඥා පනත යටතේ නගර සභා පිහිටුවා ඇති මහ නගර සභා මෙන් ම යම් නගර සභාවක් ප්‍රකාශයට පත් කිරීම, එහි සීමාව නිශ්චය කිරීම, එයට නමක් නියම කිරීමේ බලය විෂයභාර අමාත්‍යවරයාට හිමි වේ. දැනට ලංකාවේ නගර සභා 41ක් ක්‍රියාත්මක වේ. නගර සභාව සභාපතිවරයකු උපසභාපතිවරයකු සහ සභිකයින්ගෙන් සමන්විත වේ. මහ නගර සභාවලට පැවරී ඇති බලතල නගර සභාවලට ද හිමි වේ

# ප්‍රාදේශීය සභා

- 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මඟින් ප්‍රාදේශීය සභා පිහිටුවා ඇති දැනට ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සභා 271ක් ක්‍රියාත්මක වේ. මහ නගර සභාවල, නගර සභාවල මෙන් ම ප්‍රාදේශීය සභාවක් ප්‍රකාශයට පත් කිරීමේ, එහි සීමාව නිශ්චය කිරීමේ, එයට නමක් නියම කිරීමේ බලය විෂය භාර අමාත්‍යවරයාට හිමි වේ. ප්‍රාදේශීය සභා සීමාව බොහෝවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ප්‍රදේශයකට සීමා වේ. සෑම ප්‍රාදේශීය සභාවක්ම සභාපතිවරයකු, උපසභාපතිවරයකු සහ සභිකයින්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් ජීවත් වන්නේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ යි. මහ නගර සභා සතු බලතල හා කාර්ය බොහොමයක් ප්‍රාදේශීය සභාවලට ද හිමි වේ.

# ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන - 2015

| පළාත | මහනගර නගර | නගර සභා | ප්‍රාදේශීය සභා | එකතුව |
|---|---|---|---|---|
| බස්නාහිර පළාත | 07 | 14 | 27 | 48 |
| මධ්‍යම පළාත | 04 | 06 | 33 | 43 |
| දකුණු පළාත | 03 | 04 | 42 | 49 |
| උතුරු පළාත | 01 | 05 | 28 | 34 |
| නැගෙනහිර පළාත | 03 | 05 | 37 | 45 |
| වයඹ පළාත | 01 | 03 | 29 | 33 |
| උතුරු මැද පළාත | 01 | 00 | 25 | 26 |
| ඌව පළාත | 02 | 01 | 25 | 28 |
| සබරගමුව පළාත | 01 | 03 | 25 | 29 |
| එකතුව | 23 | 41 | 271 | 335 |

➢ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්ය ප්‍රධාන තේමා තුනක් යටතේ දැක්විය හැකි ය.

**1. පොදු මංමාවත් -**

- මංමාවත් ආරක්ෂා කිරීම
- නඩත්තු කිරීම
- ඉදි කිරීම
- ස්ථාන මැන බේරුම් කිරීම හා අවහිරතා ඉවත් කිරීම
- ජල මාර්ග හා ශුද්ධ පවිත්‍ර කටයුතු සඳහා නළ යෙදීම
- අතුරු පාරවල් ඉදි කිරීම

**2. මහජන සෞඛ්‍ය -**

- පොදු කානු ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම
- මහජන වැසිකිළි ඉදිකිරීම හා නඩත්තු කිරීම
- මලාපවහන පද්ධති ක්‍රමවත්ව පවත්වා ගෙන යාම
- අහිතකර ගොඩනැගිලි ඉවත් කිරීම
- පීඩා පරීක්ෂා කිරීම
- මහජන සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම

**3. පොදු උපයෝගිතා සේවා -**

- පොදු ස්ථානවලට විදුලි ආලෝකය ලබා දීම
- මහජන වෙළෙඳපොළ පවත්වා ගෙන යාම
- උයන් වතු, ක්‍රීඩා පිට්ටනි පවත්වා ගෙන යාම
- ජල සම්පාදනය
- පොදු නාන ස්ථාන පවත්වා ගෙන යාම
- පොදු කියවීම් ශාලා පවත්වා ගෙන යාම

# පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල ප්‍රයෝජන

- මහජන උපයෝගිතා සේවා පහසුවෙන් ලබාගත හැකි වීම
- ප්‍රාදේශීය නායකයින්, ජාතික නායකයින් බිහි වීමට පසුබිම සැකසීම
- ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ඵලදායී ලෙස ඉටුකර ගැනීම සහ වේගවත් කිරීම
- සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සංවිධානාත්මකව පවත්වා ගෙන යාම
- ළදරු පාසල්, මාතෘ සායන, ආයුර්වේද බෙහෙත්ශාලා යනාදිය මඟින් ජනතාවගේ අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් වර්ධනය කිරීම
- නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ විවේකය, විනෝදය සහ දැනුම ඵලදායී ලෙස පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම

# පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්තරවල වගකීම් හා වගවීම්

❖ ආණ්ඩුවේ විවිධ ස්තර වන මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා මෙන් ම පළාත් පාලන ආයතනවල මූලික වගකීම වන්නේ රාජ්‍යයේ නීතිය සහ සාමය පවත්වා ගෙන යමින් ජනතා අවශ්‍යතා උපරිම අයුරින් ඉටු කර දීමයි. ජනතා නියෝජිතයින් මෙන් ම මහජන සහභාගිත්වය ද මෙහි දී කැපී පෙනේ.

වගකීම" යනු තමාට පැවරෙන කාර්ය හොඳින් ඉටු කිරීමයි.
වගවීම" යනු එම වගකීම ඉටු කිරීම සම්බන්ධයෙන් වූ බැඳීමයි.

# පුර්වැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්තරවල වගකීම් කිහිපයක් පහත දැක්වේ.

- ප්‍රාදේශීය ආරක්ෂාව තහවුරු කිරීම මගින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම
- ප්‍රාදේශීය ආර්ථිකය වැඩි දියුණු කිරීමෙන් ජාතික සංවර්ධනය ඇති කිරීම
- නීතිය හා සාමය ආරක්ෂා කිරීම
- මහජන අවශ්‍යතාවලට අනුව නීතිරීති, ප්‍රඥප්ති සකස් කිරීම
- ජාතික අභිමානය ඉහළ නැංවීම
- පරිසර කළමනාකරණය හා පරිසර සංරක්ෂණය සිදු කිරීම
- සංස්කෘතික උරුම ආරක්ෂා කිරීම
- සමාජ සංහිඳියාව ඇති කිරීම
- මහජන උපයෝගිතා සේවා සංවිධානාත්මකව ඉටු කිරීම
- ප්‍රාදේශීය හා ජාතික සංවර්ධන කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කිරීම
- පොදු දේපළ පවත්වා ගෙන යාම, ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම
- මානව සම්පත් සංවර්ධනය හා යහපත් නායකයින් බිහි කිරීම

# ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාමට සහාය වීම

- ඵලදායි ජීවන වෘත්තියක නියැලීම
- අල්ලස, දූෂණය, නාස්තිය, වංචාව පිටු දැකීම
- නිදහස, සාධාරණත්වය සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- පොදු පහසුකම් අරපිරිමැස්මෙන් භාවිතය හා ඒවා ආරක්ෂා කිරීම
- ජාතික අභිමානය, ජාතික උරුම ආදිය රැක ගැනීමට සහ ආරක්ෂා කිරීමට දායක වීම
- දරුවන්ට, වැඩිහිටියන්ට, ආබාධිතයින්ට, රෝගීන්ට රැකවරණය, පෝෂණය සහ ආදරය ලබා දීම
- රජයේ ශුභසාධන සේවා අයථා ලෙස පරිහරණයෙන් වැළකීම හා ඒවා ආරක්ෂා කිරීමට දායක වීම

# සමාජ සංවර්ධනයට සහ යහපාලනයට සහාය වීම

- ගැටුම් ඇති කර ගැනීමෙන් වැළකීම හා ගැටුම් වැළැක්වීමට දායක වීම
- විවිධ ජන කොටස්වල අනන්‍යතාව ආරක්ෂා කිරීම හා ඒවාට ගරු කිරීම
- අන්‍ය මත ඉවසීම සහ සාධාරණාව කටයුතු කිරීම
- සාකච්ඡා මාර්ගයෙන් ගැටලු විසඳා ගැනීම හා ප්‍රචණ්ඩකාරී ක්‍රියා සඳහා යොමු වීමෙන් ඇති වන අවාසිදායක තත්ත්ව පිළිබඳ අවබෝධය
- ප්‍රාදේශීය සංවර්ධනයට ක්‍රියාකාරී ව සහාය වීම හා මඟ පෙන්වීම
- විවිධ ආපදා සහ සහන සේවා ලබා ගැනීමේ දී අවංකව හා නිවැරැදිව කටයුතු කිරීම

# පරිසර කළමනාකරණට දායක වීම

- ස්වාභාවික පරිසරය ආරක්ෂා කර ගැනීම, රැක ගැනීම සහ එහි වැදගත්කම පිළිබඳ අවබෝධය

- ස්වාභාවික පරිසරය විනාශ කිරීමට හවුල් නොවීම සහ විනාශ කරන්නන් ඉන් වැළැක්වීමට කටයුතු කිරීම

- කසළ බැහැර කිරීම වගකීමෙන් යුතුව, ක්‍රමවත් ව සිදු කිරීම

- විවිධ අහිතකර ද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමෙන් වැළකීම

- යහපත් පුරවැසියකු ලෙස හැමවිට ම කටයුතු කිරීම

**සවියෙන් පෙරට - අපි එකට**
**e - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | පුරවැසි අධ්‍යාපනය | 2 | 2. ආණ්ඩුවේ විවිධ ස්තර - ඇගයීම |

සැකසුම: ජේ.එස්.පී.ආර්.සිරිවර්ධන
පාසල : බප / හො / රෙමුණ මහා විද්‍යාලය

පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන ආණ්ඩු ක්‍රමය නම් කරන්න.
.......................................................................................................................

2) ශ්‍රී ලංකා රාජ්‍ය හඳුන්වන නාමය කුමක්ද? .............................................................

3) ඒකීය ආණ්ඩු ක්‍රමය පිලිබඳව ඒ.වී.ඩයිසිගේ නිර්වචනය කුමක්ද?
.......................................................................................................................

4) ඒකීය රාජ්‍යයන්ට උදාහරන තුනක් ලියන්න.
1......................................................................................................................

2......................................................................................................................

3......................................................................................................................

| | වර්ෂය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නම | ව්‍යවස්ථාදායකය හැඳින්වූ නම | සාමාජික ගණන | විශේෂ ලක්ෂණ |
|---|---|---|---|---|---|
| 5) | 1833 | ........................... | ව්‍යවස්ථාදායක සභාව | ........................... | ජන වාර්ගික නියෝජනය |
| 6) | ........................ | ක්‍රෲව් මැකලම් | ........................... | ........................... | සීමිත ඡන්ද බලය ලැබීම |
| 7) | 1920 | ........................ | ව්‍යවස්ථාදායක සභාව | ........................ | ........................... ........................... |
| 8) | 1931 | ............................. | රාජ්‍ය මන්ත්‍රණ සභාව | 61 | ........................... ........................... |
| 9) | ........................ | ........................... | ........................... | | කැබිනට් ආණ්ඩු ක්‍රමයක් හඳුන්වා දීම |

10.ශ්‍රී ලංකාව ඉංග්‍රීසින්ගෙන් නිදහස ලබා ගැනීමෙන් පසුව ඇති වූ අණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ දෙක සඳහන් කරන්න.

1.................................................................................................................................................

2.................................................................................................................................................

11.ශ්‍රී ලංකාව බෙදා ඇති ,

1. පළාත් ගණන කීයද? ...............................................................................................

2. පරිපාලන දිස්ත්‍රික්ක ගණන කීයද?..........................................................................

12.ඌව පළාතට අයත් දිස්ත්‍රික්ක 2 ක නම් කරන්න.

.................................................................................................................................................

13. ලංකාවේ පළාත් සභා පිහිට වූ,

1. ආණ්ඩුක්‍රම ව්‍යස්ථාව කුමක්ද? .............................................................................

2. එහි කුමන සංශෝදනයද.........................................................................................

3. කුමන පනතට අනුවද සකසා ඇතිද?.........................................................................

14)බලය විමධ්‍යගත කිරීමට ලංකාවේ පිහිටුවා ඇති ආයතන

1....................................................................... 2..............................................................................

15) ප්‍රාදේශීය ඒකක වලට බලය විමධ්‍යගත කිරීමට බල්පෑ හේතු දෙකක් ලියන්න.

1.................................................................................................................................................

2.................................................................................................................................................

16) බලය විමධ්‍යගත කිරීමේදි ඇතිවන ගැටළු දෙකක් ලියන්න.

1.........................................................................................................................................

2.........................................................................................................................................

17) ආණ්ඩුවේ විවිධ ස්තර නම් කරන්න.

1.......................................... 2............................................ 3....................................

18) මධ්‍යම ආණ්ඩුව සමන්විත ප්‍රධාන අංග තුන නම් කරන්න.

1..................................... 2............................................. 3............................................

19) එම අංග හඳුන්වන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

20) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන්,

1. මහජන ඡන්දයෙන් තේරී පත් වන මන්ත්‍රීන් සංඛ්‍යාව.........................................................................

2. ජාතික ලැයිස්තුවෙන් තේරී පත් වී මන්ත්‍රීන් සංඛ්‍යාව.........................................................................

3. පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීන් සංඛ්‍යාව .............................................................................

4. පාර්ලිමේන්තුවේ නිල කාලය ( සංශෝධනය පෙර) .........................................................................

21) ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන තුන මොනවාද?

1............................................ 2............................................... 3................................................

22) එම ආයතන සඳහා නියෝජිතනයන් තෝරා පත් කර ගන්නා,

1. මැතිවරණය කුමක්ද? ..........................................................................................

2. එය පවත්වන්නේ වසර කීයකට වරක්ද? ..........................................................................................

3. දැනට ලංකාවේ ඇති මහ නගර සභා ගණන කොපමණද? ..........................................................................

4. දැනට ලංකාවේ ඇති නගර සභා ගණන කොපමණද? ..........................................................................

5. දැනට ලංකාවේ ඇති ප්‍රාදේශීය සභා ගණන කොපමණද? ..........................................................................

23) පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්යන් බෙදිය හැකි ප්‍රධාන තේමා තුන දක්වා ඒවාට උදාහරන දෙක බැගින් ලියන්න.

1.................................................... උදා :-........................................... ................................................

2.................................................... උදා :-........................................... ................................................

3.................................................... උදා:-........................................... ................................................

24) පළාත් සභාවල සහ පළාත් පාලන ආයතන වල ප්‍රයෝජන දෙකක් ලියන්න.

1.......................................................................... 2...............................................................................

25) "වගකීම" හා "වගවීම" යන්න හඳුන්වන්න.

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

26) ආණ්ඩුවේ විවිධ ස්තර වල මූලික වගකීම විය යුත්තේ කුමක්ද?



.......................................................................................................................................................................

27, 28 , 29 , 30 ප්‍රශ්න වලට පහත සංකල්ප සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න

ආණ්ඩුවේ විවිධ ස්තර වල වගකීම හා වගවීම

පුරවැසියා කෙරෙහි

(27)
උදා:-
A..............................
B..............................
C..............................

පුරවැසියා විසින්

(28)
ජාතික ආරක්ෂාවට පවත්වාගෙන යාමට සහාය වීම
උදා:-
A..............................
B..............................
C..............................

(29)
සමාජ සංවර්ධනයට හා යහපාලනය දායක වීම
උදා:-
A..............................
B..............................
C..............................

(30)
පරිසර කළමණාකරණයට දායක වීම
උදා:-
A..............................
B..............................
C..............................

සවියෙන් පෙරට - අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | පුරවැසි අධ්‍යාපනය | 2 | 2. ආණ්ඩුවේ විවිධ ස්තර - පිළිතුරු |

සැකසුම: ජේ.එස්.පී.ආර්.සිරිවර්ධන
පාසල : බප / හො / රෙමුණ මහා විද්‍යාලය

පිළිතුරු

1) ප්‍රජාතන්ත්‍රවාදී ඒකීය ආණ්ඩු ක්‍රමයකි.

2) ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජය

3) " එක් මධ්‍යම බල ආයතනයක් පමණක් නීති පැනවීම පිළිබඳව උත්තරීතර බලය ඉසිලීම ඒකීය ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණයයි. (ඒ.වී.ඩයිසි)

4) මහා බ්‍රිතාන්‍ය , ප්‍රංශය , නේපාලය

5) කෝල්බෲක්- කැමරන් , 15

6) 1910, ව්‍යවස්ථාදායක සභාව, 21

7) මැනිං, 37, නිල නොලත් බහුතර පත්වීම./16 ක් ඡන්දයෙන් පත්වීම.

8) ඩොනමෝර්, සර්ව ජන ඡන්ද බලය ලබාදීම./ ලාංකීයන්ට දේශපාලන බලය ලැබීම./ විධායක කාරක සභා ආදිය

9) 1947, සෝල්බරි, ද්විමණ්ඩල පාර්ලිමේන්තුව, 131

10) 1) 1972- ශ්‍රී ලංකා පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

2) 1978 - ශ්‍රී ලංකා දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

11) A - පළාත් 9 B - දිස්ත්‍රික්ක 25

12) 1.බදුල්ල 2. මොණරාගල

13) A - 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව B - 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

C - 1987 අංක 2 දරන පළාත් සභා පනත

14) 1. පළාත් සභා 2.පළාත් පාලන ආයතන

15) 1. මධ්‍යම ආණ්ඩුවේ කාර්‍යයන් ලිහිල් කිරීම

2.ජනතාවගේ මූලික අවශ්‍යතා පහසුවෙන් ඉටු කර දීම.

( මේ සඳහා පෙළපොතේ තිබෙන ඕනෑම පිළිතුරක් ලිවිය හැකිය)

16) 1. සම්පත් බෙදී යාමේ විෂමතා නිසා ප්‍රාදේශීය ඒකක අතර ගැටළු ඇතිවීම.

2. බලතල ක්‍රියාවට නංවීම සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය ඒකක අතර ගැටළු ඇතිවීම.

17) 1.මධ්‍යම ආණ්ඩුව 2.පළාත් සභා 3.පළාත් පාලන ආයතන

18) 1. ව්‍යවස්ථාදායකය 2.විධායකය 3.අධිකරණය

19) 1.ව්‍යවස්ථාදායකය යනු , පාර්ලිමේන්තුවයි - ප්‍රධාන කාර්‍යය නීති පැනවීමයි

2.විධායකය යනු , විධායක ජනාධිපති ප්‍රධාන කැබිනට් මණ්ඩලයයි. –
(නීති ක්‍රියාත්මක කිරීම ප්‍රධානයි)

3. අධිකරණය යනු , ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රධාන අධිකරණ පද්ධතියයි. –
(නීති විවරණය - යුක්තිය පසිඳලීම ප්‍රධානයි)

20) 1) 196 2) 29 3) 225 4) වසර 6 (සංශෝධනයට පෙර)

21) 1) මහනගර සභාව 2) නගර සභාව 3) ප්‍රාදේශීය සභා

22) A - පළාත් පාලන ආයතන මැතිවරණය B - වසර 4 කට වරක්

C - 23 D - 41 E - 271

23) 1. පොදු මංමාවත් උදා:- මංමාවත් නඩත්තු කිරීම , ආරක්ෂා කිරීම

2 . මහජන සෞඛ්‍ය උදා:- 1. පොදු කාණු ඉදිකිරීම - අලුත්වැඩියා කිරීම

2. මහජන වැසිකිලි ඉදිකිරීම හා නඩත්තු කිරීම.

3. පොදු උපයෝගීතා සේවා උදා:- 1.පොදු ස්ථාන වලට විදුලි ආලෝකය ලබාදීම

2. ජල සම්පාදනය

24) 1. මහජන උපයෝගීතා සේවාවන් පහසුවෙන් ලබාගත හැකි වීම.

2. ප්‍රාදේශීය නායකයින් ජාතික නායකයින් බිහිවීමට පසුබිම සැකසීම.

25) " වගකීම" යනු තමාට පැවරෙන කාර්යය හොඳින් ඉටු කිරීමයි.

" වගවීම" යනු එම වගකීම ඉටුකිරීම සම්බන්ධයෙන් වූ බැඳීමයි.

26) රාජ්‍යයේ නීතිය හා සාමය පවත්වාගෙන යමින් ජනතා අවශ්‍යතා උපරිම අයුරින් ඉටු කර දීමයි.

27) නීතිය හා සාමය ආරක්ෂා කිරීම.

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම.

ජාතික අභිමානය ඉහළ නැංවීම.

28) ඵලදායී ජීවන වෘත්තීයක නියැලීම

අල්ලස , දූෂණ , නාස්තිය , වංචාව පිටු දැකීම.

පොදු පහසුකම් අරපිරිමැස්මෙන් භාවිතය හා ඒවා ආරක්ෂා කිරීම.

29) ගැටුම් ඇති කර ගැනීමෙන් වැළකීම හා ගැටුම් වැළැක්වීමට දායක වීම.

අන්‍ය මත ඉවසීම හා සාධාරණව කටයුතු කිරීම.

විවිධ ජන කොටස්වල අනන්‍යතාවය ආරක්ෂා කිරීම හා ඒවාට ගරු කිරීම.

30) කසළ බැහැර කිරීම වගකීමෙන් ක්‍රමවත්ව සිදු කිරීම.

විවිධ අහිතකර ද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමෙන් වැළකීම

ස්වාභාවික පරිසරය රැක ගැනීම , ආරක්ෂා කිරීම , එහි වැදගත්කම පිළිඳ අවබෝධය.